එකම වරදක් සඳහා ගැහැණු සහ පිරිමි යන දෙපාර්ශවයන්ගේම අය අත්අඩංගුවට ගැණෙන අවස්ථාවන්හිදී, එම වරදට සැක කරනා කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කරමින් පුවත් වාර්තා කිරීම ඇතැම් පුවත් වාර්තාවන් තුළ යම් යම් අවස්ථාවන්හිදී දක්නට ලැබේ.

ඊට උදාහරණ ලෙසින් පහත දැක්වෙන පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක. මෙහි මව්බිම පුවත් වාර්තාවේ "කාන්තාවක් ඇතුළු සිව්දෙනෙකු" අත්අඩංගුවට යනුවෙන් සඳහන් වන අතර, දිවයින පුවත් වාර්තාවේ "කාන්තාවන් ඇතුළු දෙදෙනා" රිමාන්ඩ් යනුවෙන් පැවසේ.

1) මෙහිදී කාන්තාවන්ව ඉස්මතු කොට සඳහන් කරන්නේ, එකම වරදක් කාන්තාවන් සහ පිරිමින් සිදු කළ විටකදී පවා, කාන්තාවන්ට එම වරදේ වැඩි වගකීමක් පැවරෙන බවක් පෙන්වීමට යැයි ඔබ සිතන්නේද?

2) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදු කෙරෙනා කොන් කිරීමක් සහ ඒ අනුව ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් යැයි ඔබ සිතන්නේද?

3) කාන්තාවන් ඉස්මතු කරනා මාධ්‍ය වාර්තාවන් වෙනුවට, "කාන්තාවක් සහ පිරිමින් තිදෙනෙක් අත්අඩංගුවට", "දෙදෙනෙකු අත්අඩංගුවට" වැනි කාන්තා හෝ පිරිමි කිසිම පාර්ශවයක් ඉස්මතු නොකෙරෙන වාර්තාකරණයක් යොදාගත නොහැකි යැයි ඔබ සිතන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Divaina**